www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

**6 ශ්‍රේණිය** — **පළමු වාර පරීක්ෂණය - 2019**

නම ..............................................

**භූගෝල විද්‍යාව** — **කාලය පැය දෙකයි**

**උපදෙස් :**
I කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
II කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. හිරු උදාවන දිශාවට මුහුණලා දෑත් දෙපසට දිගුකර සිටගත් විට ඔබගේ දකුණු අත විහිදෙන දිශාවෙන් දක්වෙනුයේ ...................................... දිශාවයි.
(උතුරු / දකුණු / බටහිර)

02. අඩු වේගයකින් හමන සුළං ...................................... නමින්ද හඳුන්වයි.
(සැඩ සුළං / සුළි සුළං / මඳ සුළං)

03. ශ්‍රී ලංකාවේ අනුරාධපුරය සහ පොළොන්නරුව යන ඓතිහාසික නගර දෙක අයත් වන්නේ ...................................... පළාතටය.
(උතුරු මැද / මධ්‍යම / ඌව)

04. පෘථිවියට උෂ්ණත්වය සහ තාපය ලැබුනුයේ ...................................... මගිනි.
(තාරකා / සූර්යයා / ග්‍රහලෝක)

05. උතුරු දිශාව සහ බස්නාහිර දිශාව අතර ...................................... දිශාව පිහිටා ඇත.
(ගිණිකොන / නිරිත / වයඹ)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශ කියවා එය නිවැරදි නම් (√) ලකුණද, වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත. (.......)
07. භූමි සැලැස්මක් ඇඳීමේදී දිශාව සටහන් කිරීම අවශ්‍යම අංගයක් නොවේ. (.......)
08. කාලය හා ප්‍රදේශ අනුව කාලගුණික තත්වයන්ගේ වෙනසක් ඇති නොවේ. (.......)
09. වර්ෂාව ඇති වීමට පෙර අහසෙහි අඳුරු පැහැති ඝණ වලාකුළු දක්නට ලැබේ. (.......)
10. සුළං හමා යන දිශාව අනුව ගස්වල අතු නැමී පවතී. (.......)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර, දී ඇති පිළිතුරු අතුරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතට අයත් වන දිස්ත්‍රික්කයක් වන්නේ පහත ඒවායින් කුමක්ද ?
01. බදුල්ල 02. කළුතර
03. අම්පාර 04. කෑගල්ල



agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

12. කාලගුණික තොරතුරු දැන ගැනීම වඩාත්ම ප්‍රයෝජනවත් වන්නේ පහත සඳහන් කවරෙකුටද?
    01. ගුරුවරුන්ටය
    02. වෛද්‍යවරුන්ටය
    03. ධීවරයින්ටය
    04. වඩු කාර්මිකයින්ටය
13. වර්ෂාපතනය හිඟ වීම නිසා ඇති විය හැකි ප්‍රතිඵලය මින් කුමක්ද?
    01. ගංවතුර
    02. සුළි සුළං
    03. නාය යෑම්
    04. නියගය
14. සුළගේ දිශාව මනින උපකරණය අඩංගු පිළිතුර කුමක්ද?
    01. වේගමානය
    02. අනිල මානය
    03. උෂ්ණත්ව මානය
    04. සුළං දිශා දර්ශකය
15. ශ්‍රී ලංකාවේ මීදුම සහිත කාලගුණයක් බහුලවම දක්නට ලැබෙන දිස්ත්‍රික්කය කුමක්ද?
    01. මොණරාගල
    02. වව්නියාව
    03. මන්නාරම
    04. නුවරඑළිය

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.**

ශ්‍රී ලංකාවේ ඇති කුඩාම පරිපාලන ඒකකය ග්‍රාම නිළධාරි කොට්ඨාසයයි. එය සෑදී ඇත්තේ ගමක් හෝ ගම් කිහිපයක් එකතු වීමෙනි. සෑම ග්‍රාම නිළධාරි කොට්ඨාසයකටම නිශ්චිත 16. ............................................ හා 17. ....................................... තිබේ. ග්‍රාම නිළධාරි කොට්ඨාස කිහිපයක් එකතු වීමෙන් 18. ............................ කොට්ඨාසය සෑදි ඇත. 19. ............................ දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එකතු වීමෙන් 20. ......................... සෑදී ඇති අතර එය ශ්‍රී ලංකාවේ විශාලම පරිපාලන ඒකකයයි.

(දිස්ත්‍රික්ක, නමක්, පළාත, අංකයක්, නගර, ප්‍රාදේශීය ලේකම්, උප දිසාපති)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk


Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

## II කොටස

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. අ) පහත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. ඔබ පාසල අයත් දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 01)

ii. ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය හා කුඩාම දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂර දෙක පිළිවෙළින් ලියන්න. (ල. 02)

විශාලතම දිස්ත්‍රික්කය ...............................

කුඩාම දිස්ත්‍රික්කය ...............................


iii. දකුණු පළාතට අයත් දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 01)

iv. කුරුණෑගල දිස්ත්‍රික්කයට මායිම් වන දිස්ත්‍රික්ක දෙකක අක්ෂර දක්වන්න. (ල. 02)

v. D අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය අයත් පළාත නම් කරන්න. (ල. 02)

vi. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් අයත් වන පළාත කුමක්ද? (ල. 02)

ආ) පහත රූප සටහනේ දැක්වෙන්නේ සමන්පුර ගම්මානයේ දළ සැළැස්මකි. එය උපයෝගි කර ගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.






agaram.lk

I. පාසලට උතුරින් පිහිටි ආයතනයක් නම් කරන්න. (ල. 01)

ii. පාසලට දකුණින් පිහිටි ගොඩනැගිල්ලක් නම් කරන්න. (ල. 01)

iii. පාසලට බටහිර දිශාවෙන් පිහිටි ගොඩනැගිල්ලක් නම් කරන්න. (ල. 01)

iv. තැපැල් කාර්යාලය පිහිටා ඇත්තේ පාසලේ සිට කුමන දිශාවෙන්ද? (ල. 01)

v. රෝහල පිහිටා ඇත්තේ බස් නැවතුමේ සිට කුමන දිශාවෙන්ද? (ල. 01)


vi. මහජන බැංකුවට දකුණින් පිහිටියේ කුමන ගොඩනැගිල්ලද? (ල. 01)

(02) i. වායු ගෝලීය කාලගුණික තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 08)

| කාලගුණික අංගය | මනින උපකරණය | ඒකකය |
|---|---|---|
| 01. .............................. | 02. .............................. | මිලිමීටර් |
| උෂ්ණත්වය | 03. .............................. | 04. .............................. |
| සුළඟේ වේගය | 05. .............................. | 06. .............................. |
| 07. .............................. | 08. .............................. | ඊතලයෙන් දක්වන දිශාව |


ii. කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් මිනිසාට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 03)

03. i. වර්ෂාව ඇතිවන ආකාරය දක්වෙන පහත රූප සටහනේ A,B,C, හා D යන අවස්ථා 04 පිළිවෙලින් නම් කරන්න. (ල. 08)




ii. වර්ෂාව මඟින් අපට ලබාගත හැකි ප්‍රයෝජන 03ක් ලියන්න. (ල. 03)

04. I. කාලගුණයේ විවිධ අවස්ථා දක්වෙන පහත රූප සටහනේ A, B, C හා D වශයෙන් දැක්වෙන අවස්ථා හතර පිළිවෙළින් නම් කරන්න. (ල. 04)






agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

ii. පහත සඳහන් කාලගුණ වාර්තාව හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අද පෙ.ව. 09.00 න් අවසන් වූ පැය 24 තුළ 2500mm ක උපරිම වර්ෂාපතනය වටවල ප්‍රදේශයෙන්ද 32°C ක් වූ උපරිම උෂ්ණත්වය පොළොන්නරුවෙන්ද වාර්තා විය. අවම උෂ්ණත්වය වූ 12°C වාර්තා වූයේ නුවරඑළියෙනි. නිරිත දෙසින් හමා එන සුළඟේ වේගය පැයට කිලෝමීටර 120 ක් පමණ වන අතර දිවයින අවට මුහුදු ප්‍රදේශය තරමක් රළු විය හැකිය. ඉදිරි පැය 24 තුළදී බස්නාහිර දකුණ හා මධ්‍යම කඳුකර ප්‍රදේශ වලට තද වැසි ඇතිවිය හැකිය.

(a) කාලගුණ වාර්තාවට අනුව උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වය කොපමණද? (ල. 02)

(b) කාලගුණ වාර්තාවට අනුව උපරිම වර්ෂාපතනය කොපමණ ද? (ල. 01)

(c) අවම උෂ්ණත්වය වාර්තාවන දිස්ත්‍රික්කය කුමක්ද? (ල. 01)

(d) වැඩිම වර්ෂාපතනයක් ලැබී ඇති ප්‍රදේශය කුමක්ද? (ල. 01)

(e) රට තුළට සුළං හමා එන දිශාව කුමක්ද? (ල. 01)

(f) කාලගුණ වාර්තාව මගින් හෙළිවන කාලගුණික අනාවැකිය කුමක්ද? (ල. 01)

05. I. පහත රූප සටහනේ අංක 1 සිට 8 දක්වා ඇත්තේ නිවාස වල පිහිටීමට අදාල රූප රාමු කීපයකි. එවා හොඳින් අධ්‍යයනය කර ඊට අදාල අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න. (ල. 05)




| | |
|---|---|
| • නාගරික පරිසරයක පිහිටි නිවස | |
| • බෑවුම් ප්‍රදේශයක පිහිටි නිවස | |
| • තැනිතලා බිමක පිහිටි නිවස | |
| • කඳුකර බිමක පිහිටි නිවස | |
| • වෙරළ ආශ්‍රිත පරිසරයක පිහිටි නිවස | |

ii. පහත දැක්වෙන තොරතුරු වලින් ස්වභාවික ලක්ෂණ හා මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ වරහන් තුළින් තෝරා වෙන වෙනම ලියන්න. (ල. 06)

(වනාන්තර, උස්බිම්, ගොඩනැගිලි, ගංගා, උද්‍යාන, වගාබිම්)


ස්වභාවික ලක්ෂණ ........................................................................................

මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ ........................................................................................



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

06. ඔබට සපයා ඇති උපකාරක පද ඇසුරින් පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




(ල. 11)

<u>පහළට</u>

01. කෙටි කාලයක් තුළ වායුගෝලයේ ඇති වන වෙනස මේ නමින් හඳුන්වයි.
02. සූර්ය රශ්මිය නිසා ජලය වාෂ්ප වීමයි.
04. විධිමත් අධ්‍යාපනයක් ලබා දෙන ආයතනයකි.
05. වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
07. අහසේ වළාකුළු වල ස්වභාවය මේ මගින් දැනගත හැකිය.
08. දිශාව බලා ගැනීමට භාවිතා කරන උපකරණයකි.

<u>හරහට</u>

03. වලාකුළු නිර්මාණය වන්නේ මේවා ඝනීභවනය වීමෙනි.
06. සුළගේ වේගය මනින උපකරණයකි.
09. ඌව පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
10. ගස්වල බීජ ව්‍යාප්තියට සහාය වේ.
11. ප්‍රධාන කාලගුණ අංගයකි.

07. i. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

ii. ශාක මගින් සතුන්ට ලැබෙන ප්‍රයෝජන දෙකක් සහ මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙකක් වෙන වෙනම ලියන්න. (ල. 04)

iii. 'අ' තීරුවට ගැලපෙන නිවැරදි පිළිතුර ''ආ'' තීරුවෙන් තෝරා ඊට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|
| 01. ගිරවා | (..........) | A වගාවන්ට හානි කරන ගොලුබෙල්ලන් විනාශ කිරීම. |
| 02. කපුටා | (..........) | B කුඹුරු වලට හානි කරන කෘමීන් විනාශ කිරීම. |
| 03. වේයා | (..........) | C පස බුරුල් කිරීම සහ පස සරු කිරීම. |
| 04. ඇටි කුකුළා | (..........) | D විවිධ අපද්‍රව්‍ය කැබලි කොට දිරාපත් කිරීමට උපකාරී වීම. |
| 05. බත් කුරා | (..........) | E පරිසරයට සෞන්දර්ය එක් කිරීම. |
| | | F කුණු කසල කා දැමීම. |

(ල. 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk